**08-01-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ කිසිම විටෙක, කිසි දෙයක් පිළිබඳව, ව්‍යාජ අහංකාරකමක් ඇති කර නොගත යුතුයි. මෙම රථයට මුළුමනින්ම ගරු කරන්න.

**ප්‍රශ්නය:** ඔය දරුවන්ගෙන් කෝටි ප්‍රමාණයක් වාසනාවන්ත වන්නේ කුමන දරුවන්ද, අවාසනාවන්ත වන්නේ කුමන දරුවන්ද?

**පිළිතුර:** ඔවුන්ගේ ක්‍රියාකාරකම්, දේවතාවන්ගේ මෙන් වන දරුවන්, සෑම කෙනෙකුටම සතුට දෙන දරුවන්, කෝටි පමණින් භාග්‍යවන්ත වන අතර, අසමත් වන අයට, අවාසනාවන්ත බව කියයි. සමහරු අන් අයට දිගටම දුක් දී, විශාල වශයෙන් අවාසනාවන්ත වෙයි. ඔවුන් සතුට ලබා දෙන අන්දම නොදනී. බාබා පවසන්නේ : දරුවනි, තමන්ව හොඳින් රැක බලාගන්න. සියල්ලන්ටම සතුට ලබා දී, අගනා අය වන්න.

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික පියා මෙතැන අසුන් ගෙන, ආධ්‍යාත්මික දරුවන්ට විස්තර කරයි. මෙම විශ්ව විද්‍යාලයේ අසුන් ගැනීමෙන්, ඔබ උසස් තත්ත්වයක් හිමි කරගනී. ඔබ දිව්‍ය ලෝකයේ උසස්ම උසස් තත්ත්වය හිමි කරගන්නා බව, ඔබගේ හදවතින් ඔබට වැටහෙනවා. එවන් දරුවන්ට බොහෝ සතුට තිබිය යුතුයි. ඔය සෑම කෙනෙකුටම විශ්වාසය තිබෙන නමුත් ඔබ සෑම කෙනෙක්ම එක වගේ නැත. පළමුවැන්නා සිට අන්තිමයා තෙක්, ඔබ සෑම කෙනෙක්ම අංකානුරූපයි. ප්‍රශ්න පත්‍රයකදී, අංක එකේ සිට අවසන් අංකය තෙක් ඔවුන් අංකානුරූප වෙයි. ඇතැමුන් සමත් වන අතර, ඇතමුන් අසමත් වෙයි. ඔබ සෑම කෙනෙකුටම තමන්ගේ හදවතින් විමසිය හැක බාබා මාව බොහෝ උසස් කරවනවා, එහෙත් මා කෙතරම් වටින්නේද? මා අහවලාට වඩා හොඳද එසේ නැත්නම් මට අඩු වටිනාකමක් තිබෙන්නේද? මෙය ඉගෙනුමක්. සමහර විෂයයන්වල දුර්වල අය, අඩු ශ්‍රේණියක් ලබන බව පෙනෙයි. කෙනෙක් ශිෂ්‍ය නායකයෙක් වුවත්, ඇතැම් විෂයන්වල දුර්වල නම්, ඔහුටද අඩු ශ්‍රේණිගත කිරීමක් ලැබෙයි. ශිෂ්‍යත්වයක් දිනාගන්නේ ඉතා ටික දෙනෙක් පමණයි. මෙයත් පාසැලකි. ඔබ සෑම කෙනෙක්ම ඉගෙනගන්නා බව ඔබ දන්නවා. මෙහි ඇති පළමුවන සහ ප්‍රධානතම දෙය වන්නේ පාරිශුද්ධත්වයයි. ඔබ පරම පියාට කන්නලව් කළේ, ඔබට පිවිතුරු වීමටයි. ඔබගේ සාපරාදී දෑස් ක්‍රියාත්මක වන විට, ඔබටද එය දැනෙයි. සමහරුන් බාබාට ලියන්නේ බාබා, මා මෙම විෂයෙහි දුර්වලයි. ඔවුන් විශේෂිත වූ විෂයකින් දුර්වල බව, ශිෂ්‍යයින්ගේ බුද්ධියේ අනිවාර්යයෙන්ම රැඳී තිබෙයි. ඔවුන් අසමත් වන බවද ඇතම් අය විශ්වාස කරති. මෙහි අංක එකේ විෂය වන්නේ පාරිශුද්ධත්වයයි. ඔවුන් පරාජය වූ බව, බොහෝ දෙනෙක් ලිපි මඟින් ලියා එවයි. එබැවින් ඔබ එයට කුමක්ද කියන්නේ? ඔවුන්ට ඉහළ නැඟීමට නොහැකි වන බව, ඔවුන්ගේ හදවත් වලට දැනෙයි. ඔබ පිවිතුරු ලෝකය ස්ථාපිත කරමින් සිටිනවා. ඔබගේ අරමුණ සහ ඉලක්කය මෙයයි. පරම පියා පවසන්නේ දරුවනි, නිරතුරුවම මා පමණක් සිහි කර, පිවිතුරු වන්න, එවිට ඔබට ලක්ෂ්මී සහ නාරායනගේ රජ පෙළපතට ඇතුළු වීමට හැකි වෙයි. ශිෂ්‍යයෙකුට උසස් තත්ත්වයක් හිමි කරගැනීමට හැකි වෙයිද, නොහැකි වෙයිද කියා ගුරුවරයෙකුට වටහාගැනීමට හැකිය. එම කෙනා උත්තරීතර ගුරුවරයාය. මෙම දාදා පාසැලේ ඉගෙනගත්තා. සමහර දරුවන් බොහෝ නරක දේ කරන අතර, අවසානයේදී ඔවුන්ට දඬුවම් කිරීමට ගුරුවරයාට සිදුවෙයි. පෙර කල ඔවුන් බොහෝ දැඩි දඬුවම් ලබා දුන්හ. දැන් දඬුවම් අඩු කර ඇති බැවින් ශිෂ්‍යයින් පෙරටත් වඩා නරක් වෙයි. මෙකල ශිෂ්‍යයින් බොහෝ කලබල ඇති කරයි! ශිෂ්‍යයින් ‘නව රුධිරය’ ලෙස හැඳින්වෙයි. ඔවුන් කරන දේවල් බලන්න! ඔවුන් භාණ්ඩ වලට ගිණි තබමින් ඔවුන්ගේ තාරුණ්‍යයේ බලය පෙන්වයි. මෙය රකුසු ලෝකයයි. තරුණ පිරිමින් බොහෝ නරකයි ඔවුන්ගේ දෑස් බොහෝ සාපරාදීයි. පිටතින් ඔවුන් බොහෝ හොඳ බව පෙනෙයි. මෙවැනි කියමනකි දෙවියන්ගේ පත්ලට ඔබට ළඟා විය නොහැක. ඒ අන්දමින්ම, ඔවුන් කුමන ආකාරයේ මනුෂ්‍යයින්ද කියා දැන ගැනීමට, ඔවුන්ගේ පත්ලට ළඟා වීමට ඔබට නොහැක. ඔව්, ඔවුන් ඉගෙන ගන්නා ආකාරයෙන් සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම් කෙසේද කියා දැකීමෙන්, ඔවුන්ගේ බුද්ධි, කෙතරම් ඥානය උකහාගෙන තිබේද කියා ඔබට වටහා ගත හැක. ඇතැමුන් කතා කරන විට, ඔවුන්ගේ දෙතොලින් මල් වැහෙන්නා සේද, වෙනත් අය කතා කරන විට, ඔවුන් ගල් ගසන්නා සේය. බලන විට ඔවුන් බොහෝ හොඳ වෙයි කියා ඔබට සිතෙයි, තවද ඔවුන් ඥානයේ කරුණුද සටහන් කරගනී, නමුත් ඔවුන්ට තිබෙන්නේ ගල් වැනි බුද්ධීන්ය! ඔවුන්ට තිබෙන්නේ බාහිර ශෝබනය පමණයි! මායා බොහෝ බලවත්ය, මේ නිසයි, මෙම දැනුමෙන් විශ්මයට පත් වී, එය අන් අයටත් කියා දුන් අය, ශිව බාබාගේ දරුවන් යැයි කියාගත් අය, පසුව පැන ගිය බව සිහි කෙරෙන්නේ, එනම්,

ඔවුන් ද්‍රෝහීන් විය. දක්ෂ අය ද්‍රෝහීන් නොවෙයි කියා නොසිතන්න! ඉතා හොඳ සහ දක්ෂ අයත් ද්‍රෝහීන් බවට පත්වෙයි. භෞතික හමුදාවලද එය එසේය ඔවුන් වෙන රටකට ගුවන් යානයක් ගෙන පැන යයි. මෙහිද එසේය. ස්ථාපනයට බොහෝ උත්සාහයක් අවශ්‍යයි. දරුවන් ඉගෙනගැනීමට බොහෝ උත්සාහ දැරිය යුතු අතර, ගුරුවරුන් ඉගැන්වීමට බොහෝ උත්සාහ දැරිය යුතුයි. පාසැලක, ශිෂ්‍යයෙක් වෙන අයට බාධා කරමින් ඉගෙන නොගන්නා බව දකින විට, ඔහුට දඬුවම් කරයි. එම කෙනා, පියාය. පියා කිසි දෙයක් නොපවසයි. එම නීතිය පියාට අදාල වන්නේ නැත. මෙහිදී ඔබ සම්පූර්ණයෙන්ම සාමයෙන් සිටිය යුතුයි. පරම පියා, සතුට පිරිනමන්නාය, සෙනෙහසේ මහා සාගරයයි. එබැවින් ඔය දරුවන්ගේ හැසිරීම, දේවතාවන්ගේ මෙන් විය යුතුයි. ඔබ කෝටියක් භාග්‍යවන්ත බව, බාබා ඔය දරුවන්ට සෑම විටෙකම පවසයි. කෙසේවෙතත්, ඔබගෙන් ඇතැම් අය කෝටියක් අවාසනාවන්ත වෙයි. අසමත් වන අයට කිව හැක්කේ ඔවුන් අවාසනාවන්ත බවයි. මෙය අවසානය දක්වාම සිදුවන බව, බාබා දන්නවා. සමහරුන් අනිවාර්යයෙන්ම විශාල වශයෙන් අවාසනාවන්ත වෙයි. ඔවුන්ගේ හැසිරීම කෙසේද යත්, ඔවුන්ට මෙහි සිටීමට නොහැකි වන බව, ඔවුන් මෙතරම් ශ්‍රේෂ්ඨ වීමට තරම් නොවටිනා බව වටහාගත හැක. ඔවුන් දිගින් දිගටම සෑම කෙනෙකුටම දුක් දෙයි. ඔවුන් සතුට ලබා දීමටවත් නොදන්නා බැවින්, ඔවුන්ගේ තත්ත්වය කෙබඳු වෙයිද? බාබා සෑම විටෙකම පවසන්නේ දරුවනි, ඉතා හොඳින් තමන්ව රැකගන්න. නාටකයට අනුව, මේ සෑම දෙයක්ම සිදු වීමට තිබෙනවා. ඔවුන් යකඩ වලටත් වඩා අන්ත වනවා. බොහෝ හොඳ අය පවා, කිසි විටෙක ලිපියක්වත් නොලියයි. එම අසරණ දුගී අයගේ තත්ත්වය කෙබඳු වෙයිද? පරමාත්ම පියා පවසන්නේ මා පැමිණ සිටින්නේ සෑම කෙනෙකුටම සෙත සැලසීමටයි. අද මා සෑම කෙනෙකුටම විමුක්තිය පිරිනමන අතර, හෙට දින ඔවුන් පහත් වෙයි. ඔබ පවසන්නේ, ඔබ ඊයේ දිනයේ ලෝකයේ අධිපතියන්ව සිටි බවත්, අද දින වහලුන් වී ඇති බවත්ය. ඔය දරුවන්ගේ බුද්ධිය තුළ දැන් මුළු වෘක්ෂයම ඇත. මෙම වෘක්ෂය ආශ්චර්යමත්ය! මනුෂ්‍යයින්ට මෙම වෘක්ෂයවත් වැටහෙන්නේ නැත. චක්‍රයක් යනු, සම්පූර්ණ වසර 5000 ක නිවැරදි වෘක්ෂය බව ඔබ දන්නවා. තත්පරයකවත් වෙනසක් විය නොහැක. ඔය දරුවන්ට දැන් මෙම අසීමිත වෘක්ෂයේ ඥානය ලැබෙනවා. ඔබට මෙම ඥානය ලබා දෙන කෙනා, වෘක්ෂයේ අධිපතිය. බීජයක් බොහෝ කුඩා වුවත්, ඉන් කෙතරම් ඵල මතුවන්නේද කියා බලන්න. මෙම වෘක්ෂයද බොහෝ ආශ්චර්යමත් වන අතර, එහි බීජය, බොහෝ කුඩාය! ජීවාත්මයක් බොහෝ කුඩාය! පියාද ඉතාමත්ම කුඩාය. ඔහු මෙම ඇසට නොපෙනෙයි. ඔහුගේ ගුරුගෙන් ආලෝකයක් මතු වී තමන් තුළට ඇතුළු වූ බව පවසන, විවේකානන්දගේ නිදසුන ගැන ඔවුන් කියයි. ආලෝකයක් එක් අයෙකුගෙන් පිට වී, තව කෙනෙක් තුළට ඒ ආකාරයෙන් ඇතුළු විය නොහැක. ඔහුගෙන් පිටතට පැමිණියේ කුමක්ද කියා ඔවුන්ට වැටහෙන්නේ නැත. බොහෝ දෙනෙකුට එවන් දර්ශන ඇතිවෙයි. ඒ මිනිසුන් ඒ ගැන විශ්වාස කරන අතර, ඉන්පසුව ඒ පිළිබඳව ලිපි පවා පල කරයි. පරමාත්ම දෙවියන් පවසන්නේ මනුෂ්‍යයින්ගේ ප්‍රශංසාවක් නොමැත. ප්‍රශංසා තිබෙන්නේ දේවතාවන්ගේ පමණයි. ඔවුන් මෙන් දේවතාවන් බවට ඔබව පත් කරවන ඒකායන කෙනාගේ ප්‍රශංසාවද තිබේ. බාබා බොහෝ හොඳ කාඩ්පත් සාදවා තිබේ. ඔබ කාගේ හෝ උපන් දිනයක් සැමරීමට යන්නේ නම්, එය ශිව බාබාගේ විය යුතුයි. ලක්ෂ්මී සහ නාරායනව එය බවට පත් කලේ ශිව බාබාය. ප්‍රශංසාව තිබෙන්නේ ඒකායන ඔහුගේ පමණයි. එම කෙනාව පමණක් සිහිපත් කරන්න. මෙම කෙනා පවසන්නේ මම උසස්ම කෙනා බවට පත් වී, පසුව මා පහළට පැමිණෙන්නෙමි. වඩාත්ම උසස් ලක්ෂ්මී සහ නාරායන, උපත් 84 ක් ගෙන, ඉන්පසුව පහළට බසින බව කිසි කෙනෙක් නොදනී. එයම ඔබටද බලපායි! ලොවෙහි අධිපතියන් වූයේ ඔබයි ඔබ දැන් පත්ව සිටින්නේ කවුරුන් බවටද? ස්වර්ණමය යුගයේ සිටියේ කවුද? ඔබ දරන උත්සාහයට අනුව, අංක පිළිවෙලට, ඔබ සියලු දෙනාම එහි සිටියා. රජවරුන් සහ රැජිනියන් සිටියා. සූර්ය රජ පෙළපතේ මෙන්ම චන්ද්‍ර රජ පෙළපතේ අයද සිටියා. බාබා ඔබට ඉතා හොඳින් පහදා දෙයි! ඔය දරුවන් ඇවිදින විට සහ එහෙ මෙහෙ යන විට, ලෝක චක්‍රය පිළිබඳ ඥානය ඔබගේ බුද්ධිය තුළ තබා ගත යුතුයි. ඔබ ජීවමාන ප්‍රදීපාගාරයි. මුළු ඉගෙනුමම ඔබගේ බුද්ධිය තුළ තිබිය යුතුයි. කෙසේවෙතත්, ඔබ තවමත් එම තත්ත්වයට පත්වී නැහැ එය ඉදිරියට පැමිණෙන්නට තිබේ! සම්මාන ඇතුව සමත් වීමට ඇති අයගේ ස්ථිතිය මෙය වෙයි. මුළු දැනුමම ඔවුන්ගේ බුද්ධිය තුළ තිබෙයි. එවිට පමණයි, ඔබට පියාගේ ආදරණීය, සෙනෙහෙබර දරුවන් යැයි කියනු ලබන්නේ. බාබා, එවන් දරුවන්ට, දිව්‍යලෝකයේ රාජධානිය කැප කරයි. ඔහු පවසන්නේ මා රාජධානිය පාලනය කරන්නේ නැත මා එය ඔබට දෙන්නෙමි. මෙයට පරාර්ථකාමී සේවය යැයි කියයි. පරම පියා ඔබව ඔහුගේ හිස මත ඉන්දවන බව ඔය දරුවන්ට වැටහෙනවා. එබැවින් ඔබ එවන් පියෙක්ව බොහෝ සේ සිහිකළ යුතුයි! මෙම නාටකය පෙර නියම වූවකි. පරමාත්ම පියා සංගම යුගයේදී පැමිණ, ඔවුන්ගේ උත්සාහයන්ට අනුව, අංක පිළිවෙලට, සෑම කෙනෙකුටම විමුක්තිය පිරිනමයි. අංක එකට සිටින්නා, උසස්ම මෙන්ම

සම්පූර්ණයෙන්ම පාරිශුද්ධ කෙනා වන අතර, අවසන් අංකය සම්පූර්ණයෙන්ම අපවිත්‍රයි. බාබා, සෑම කෙනෙකුටම සෙනෙහස සහ සිහිපත් කිරීම ලබා දෙයි. බාබා බොහෝ හොඳින් පැහැදිලි කරයි! ඔබට කිසි ව්‍යාජ අහංකාරකමක් නොතිබිය යුතුයි. පරම පියා පවසන්නේ ඔබ අවධානයෙන් සිටිය යුතු අතර රථයටද ගරු කළ යුතුයි. පරම පියා ඥානය පවසන්නේ මෙම කෙනා මහින්ය. මෙම කෙනාට පෙර, කිසිදා අපහාස නොකෙරුණු සෑම කෙනෙක්ම ඔහුට ආදරය කළා. දැන් බලන්න, ඔහු කොපමණ අපහාස ලබන්නේද කියා! සමහරුන් ද්‍රෝහීන් වී, පැන ගියා, එබැවින් ඔවුන්ගේ තත්ත්වය කුමක් වෙයිද? ඔවුන් අසමත් වෙයි, එහෙම නේද? පියා විස්තර කරන්නේ මායා මේ වගෙයි. එබැවින් බොහෝ ප්‍රවේසමින් සිටින්න. මායා කිසි කෙනෙක්ව අත්නොහරියි ඇය නොයෙක් ආකාරයේ ගිනි අවුලවයි. පරම පියා පවසන්නේ මගේ සියලුම දරුවන්, රාගයේ කොත මත අසුන් ගැනීමෙන්, සම්පූර්ණයෙන්ම අවලස්සන වී සිටියි. සෑම කෙනෙකුටම එක වගේ විය නොහැක එසේම ඔබ සෑම කෙනෙකුටම එකම චරිත කොටසද නොමැත. මෙම ස්ථානයට ගණිකා මඩමක් යැයි කියයි සෑම කෙනෙක්ම රාගයේ කොත මත බොහෝ වාර ගණනක් අසුන් ගන්නට ඇති! රාවණ බොහෝ බලවත්ය! ඔහු ඔබගේ බුද්ධි අපවිත්‍ර කරයි. මෙහි පැමිණ, පියාගෙන් ඉගෙනුම් ලබා ගත් අය පවා, එසේ වී තිබේ. ඔබ පරම පියාව සිහිකිරීමෙන් හැර, ඔබගේ සාපරාදී දෑසට කිසි විටෙක පරිවර්ථනය විය නොහැක. මේ නිසයි සූරදාස්ගේ (තමන්ව අන්ධ කරගත් කෙනෙක්) කතා පුවත තිබෙන්නේ. එය ඔවුන් නිදසුනක් ලෙසින් ගොතපු කතාවක් පමණයි. ඔය දරුවන්ට දැන් ඥානයේ තෙවැනි ඇස ලැබී තිබේ. අවිද්‍යාව යනු අන්ධකාරයයි. ‘ඔබ අන්ධයෙක්’යැයි කියන විට, ඉන් අදහස් වන්නේ ‘ඔබ අඥානයෙක්’ යන්නයි. ඥානය අදෘෂ්‍යමාන වන අතර යමක් කීම පිළිබඳ ප්‍රශ්නයක් නැත. සියලුම ඥානය තත්පරයකදී ඉස්මතු වෙයි. සියල්ලටම වඩා පහසුම වන්නේ ඥානයයි. කෙසේවෙතත්, මායාගෙන්, අවසානය දක්වාම දිගටම පරීක්ෂණ පැමිණෙයි. මේ කාලයේදී ඔබ සිටින්නේ කුණාටු මැදයි. ඔබ ශක්තිමත් වූ විට, එතරම් කුණාටු ඇති නොවන අතර ඔබ ඇද නොවැටෙයි. එවිට ඔබගේ වෘක්ෂය කෙතරම් වර්ධනය වෙයිද කියා බලන්න! එය බොහෝ සුප්‍රසිද්ධ වෙයි. ගසක් සෑම විටෙකම වර්ධනය වෙයි. සුළු විනාශයක් සිදු වන විට, ඔබ බොහෝ අවධානයෙන් සිටීවි. එවිට ඔබ සිහිපත් කිරීම තුළින් පරමාත්ම පියාට එල්ලී සිටියි. ඉතිරිව තිබෙන්නේ ඉතාමත්ම කෙටි කාලයක් පමණක් බව, ඔබට වැටහෙයි. පියා ඉතා හොඳින් පැහැදිලි කර දෙයි එකිනෙකා සමග බොහෝ සෙනෙහසින් සම්බන්ධතා පවත්වන්න. කිසිම කෙනෙකුට සැර බැල්මක් නොපෙන්වන්න. කෝපය නමැති නපුරු භූතයා පැමිණි විට, මුහුණ සම්පූර්ණයෙන්ම වෙනස් වෙයි. ලක්ෂ්මී සහ නාරායන මෙන් මුහුණු ඇති අය බවට ඔබ පත් විය යුතුයි. ඔබගේ අරමුණ සහ ඉලක්කය ඔබ ඉදිරියේ තිබේ. ඔබ මාරු වී යාමට ඇති විට, අවසානයේදී දර්ශන ඇති වෙයි. පියා ඔබ සියල්ලන්වම බොහෝ සතුටට පත් කළා! අවසානයේදී ඔබ බොහෝ කොටස් දකිනා අතර, බොහෝ ප්‍රීතියෙන් රැඳී සිටිනු ඇත. මෙවැනි කියමනකි ‘දඩයම් සතාට මරණය සහ දඩයම්කරුට සතුට!’ අවසානයේ බොහෝ ජවනිකා දැක ගැනීමට සිදුවෙයි, පසුතැවිලි වීම ඇතිවන්නේ මේ නිසාය මෙයයි මා කළේ! එවිට ඒ සඳහා දඬුවම් බොහෝ දැඩි වෙයි. පරම පියා පැමිණ ඔබට උගන්වයි. ඔබ ඔහුගේ ගරුත්වය රකින්නේ නැත්නම්, දඬුවම් ඇතිවෙයි. වැඩිම දඬුවම් අත්විඳින්නේ, පාපයේ ගැලෙන සහ බොහෝ සෙයින් ශිව බාබාට අපහාස ගෙන ඒමට උපකරණ වන අයටයි. මායා බොහෝ සේ බලගතුය. බලන්න ස්ථාපනය සිදුවන අතර සිදුවන දේවල් දෙස. ඔබ දැන් දේවතාවන් බවට පත්වෙමින් සිටිනවා. ස්වර්ණමය යුගයේ රකුසන් ආදිය නොමැත. ඉන් හැඟින්වෙන්නේ සංගම යුගය පිළිබඳවයි. දූෂිත මනුෂ්‍යයින් බොහෝ සේ දුක ඇති කරයි! ඔවුන් තම දියණියන්ට පහර දී, ඔවුන්ට විවාහ වීමට බල කරයි. පාපය වෙනුවෙන් ස්ත්‍රීන්ට බොහෝ පහර දෙනු ලබයි. ඔවුන් බොහෝ එදිරිවාදිකම් වලට මුහුණ පායි! එම මිනිසුන් පවසන්නේ සන්‍යාසීන්ටවත් පිවිතුරුව සිටීමට නොහැකි නම්, ඔබ පිවිතුරුව සිටින බව කීමට තරම්, ඔය මිනිසුන් කවුරුන්ද? ඔබ දියුණුවත්ම ඔවුන්ට අනිවාර්යෙන්ම වැටහෙනු ඇත. පාරිශුද්ධත්වය නොමැතිව ඔබට දේවතාවන් විය නොහැක. ඔබ ඔවුන්ට පවසන්නේ, ඔබට බොහෝ ප්‍රාප්තීන් ලැබෙන නිසයි, ඔබට සෑම දෙයක්ම අත්හැරීමට හැකි වන්නේ කියා. පරමාත්ම දෙවියන් පවසයි රාගය පරාජය කරන්නන්, ලෝකය ජය ගනී! ඔබ ලක්ෂ්මී සහ නාරායන මෙන් වීමට යන්නේ නම්, ඔබ පාරිශුද්ධව රැඳී නොසිටින්නේ මන්ද? කෙසේවෙතත්, මායාට ඔබව බොහෝ සේ වැට්ටීමට හැකිය. මෙම ඉගෙනුම බොහෝ ශ්‍රේෂ්ඨයි. පරම පියා පැමිණ ඔබට උගන්වයි. සමහර දරුවන්ට මෙය හොඳින් සිහි නොවන විට, මායා ඔවුන්ට පහර දෙයි. මායා සමහරුන්ව, බොහෝ සෙයින් මට අකීකරු කරවයි. එවිට, එවන් ජීවයන්ගේ තත්ත්වය කෙබඳු වෙයිද? මායා ඔබව බොහෝ නොසැලකිලිමත් සහ අහංකාර කරවයි, අහන්නවත් එපා! රාජධානිය නිර්මාණය වන්නේ අංක පිළිවෙලටයි. එබැවින් එය ඒ අන්දමින් නිර්මාණය විය යුත්තේ යම් හේතුවකටයි! ඔබට දැන් අතීතය, වර්තමානය සහ අනාගතය පිළිබඳ ඥානය ලැබෙනවා. එබැවින් ඔබ බොහෝ සේ අවධානය යොමු කළ යුතුයි! අහංකාරකම පැමිණි වහාම ඔබ

මියැදෙයි. මායා ඔබව මුළුමනින්ම පැන්සයක් තරම්වත් වටිනාකමක් නැති අය බවට පත් කරවයි. ඔබ පියාට අකීකරු වන විට, ඔබට ඔහුව සිහි කළ නොහැක. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. එකිනෙකා සමග බොහෝ සෙනෙහසින් කටයුතු කරන්න. කිසිම විටෙක කෝප නොවන්න, එමෙන්ම කිසි කෙනෙකුට සැර බවක් නොපෙන්වන්න. කිසිම විටෙක පියාට අකීකරු නොවන්න.
2. සම්මාන සහිතව සමත් වීම සඳහා, ඉගෙනුම ඔබගේ බුද්ධියේ තබාගන්න. ජීවමාන ප්‍රදීපාගාරයක් වන්න. දිවා රාත්‍රියේ මෙම ඥානය, ඔබගේ බුද්ධියෙන් ආවර්ජනය කරන්න.

**වරදානය:** සර්ව බලධාරී පියාගේ අධිකාරීත්වය කෙරෙහි ඔබේ බුද්ධියේ නොසැලෙන විශ්වාසය ඇති වී, සෑම කාර්යයක්ම පහසු වේවා.

ඔබ ඔබේ සියලු කටයුතු බොහෝ උසස් සර්වබලධාරී පියාගේ අධිකාරීත්වයෙන් යුතුව ඉටු කරයි. කිසිවෙකුට ඔබව සෙලවිය නොහැකි වන පරිදි මේ කෙරෙහි ඔබේ විශ්වාසය නොසැලෙන බවට පත් කර ගන්න. එසේ කිරීමෙන්, ඔබ කොතරම් විශාල කාර්යයක් කළත්, එය පහසු බව ඔබට අත්විඳිය හැකිය. වර්තමානයේ, මිනිස් මොළය භාවිත කිරීමෙන් තොරව ඕනෑම ප්‍රශ්නයකට පහසුවෙන් පිළිතුරක් ලබා ගත හැකි ආකාරයේ එවැනි යන්ත්‍රෝපකරණ විද්‍යාව මඟින් සොයාගෙන ඇත. එලෙසම, ඔබ සර්වබලධාරී අධිකාරීත්වය ඔබ ඉදිරියෙහි තබා ගන්නා විට, ඔබට සෑම ප්‍රශ්නයකටම පහසුවෙන් පිළිතුරක් ලැබෙනු ඇති අතර මෙම මාර්ගය පහසු බව අත්විඳිනු ඇත.

**පාඨය:** බාහිර බලපෑමකට යටත්ව සිටින ඔබේ අවධිය පරිවර්තනය කිරීමට ඔබේ ඒකාග්‍රතාවයේ බලය භාවිත කරන්න.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: මෙම අව්‍යක්ත මාසයේ, බන්ධනයෙන් නිදහස් වී ජීවන මුක්ති අවධිය අත්විඳින්න.**

බ්‍රහ්මින් ජීවිතයේ සතුට ඇත්තේ ජීවන මුක්ති අවධියේදී ය. නොබැඳී වීම යනු මුක්තිය ලැබීමයි. ඔබේ සංස්කාර වලට පවා යටත් නොවන්න. "මට කළ හැක්කේ කුමක් ද? මට මෙය කළ හැක්කේ කෙසේද? මට මෙය කිරීමට අවශ්‍ය නොවීය, නමුත් එය සිදු විය". මෙයින් අදහස් කරන්නේ බන්ධන ජීවිතයක සිටීමයි. ඔබට කිසිදු ආශාවක් (ඉච්චා) නොතිබුණි, නමුත් ඔබ කැමති(අච්ච) විය. නිවැරදි කිරීමක් කිරීමට හැකිව තිබූ නමුත් ඔබ ඒ වෙනුවට කෝපයට පත් විය. මෙය බන්ධන ජීවිතයක අවධියයි. බ්‍රහ්මින්වරයෙකු යනු ජීවන මුක්තිය ලද අයෙකි; එවැනි ජීවාත්මයක් කිසි විටෙකත් කිසිදු බන්ධනයකින් බැඳිය නොහැක.